# බුලත් හා බැඳුණු අස්පර්ශිත උරුමය පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය ඩී. නාරද හිමි

සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.
dothaluoyanarada2000@gmail.com

**මුඛ්‍ය පද** - අස්පර්ශිත උරුමය, ජන කවි, ප්‍රස්තාව පිරුළු, බුලත්

## හැඳින්වීම

අස්පර්ශිත උරුමයට අයත් වන්නේ අතීත ජන සමාජයන් සතුව පැවති සමාජ විඥානයට අයත් කොටස ය. එය එම ජන සමාජයන්හි විසූවන්ගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා හා උවමනාවන් පදනම් කොටගෙන ඇති වූ අදහස්, ආකල්ප, දෘෂ්ටිකෝණ, විශ්වාස, සංකල්ප, විනිශ්චයන් යනාදී වන සියල්ල තුළින් පැන නැගුණකි. ස්වභාවික (Natural Heritage) හා සංස්කෘතික (Cultural Heritage) උරුමයට හිමිකම් කියන ශාකයක් වූ බුලත් පිළිබඳ මෙහි දී අධ්‍යයනය කර ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ බුලත් හා බැඳුණු අස්පර්ශිත උරුමය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. බුලත් හා බැඳුණු  අස්පර්ශිත උරුමයේ විවිධතා කවරේ ද?  බුලත් සමාජයේ භාවිත කරන්නේ කෙසේද? යන්න පැහැදිලි කරගැනීම මෙහි පර්යේෂණ ගැටළු විය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා භාවිත කරන ලද පර්යේෂණ ක්‍රමවේදය වන්නේ පුස්තකාල අධ්‍යයනයයි. මෙහි දී විශේෂ වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ග්‍රන්ථ අධ්‍යයනය කළ අතර ඒවායෙහි අන්තර්ගත කරුණු විධිමත් ලෙස විවරණය කිරීම තුළින් උක්ත කාරණය විමර්ශනයට ලක් කිරීම සිදු කර ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පරිසරයේ ඇති තුරුලතා අතර බුලත් ශාකය මිනිසා හා නිතරම ගැටෙන මිනිස් ජීවිතය හා බැඳී පවතින ශාකයකි. උද්භිද විද්‍යාත්මකව පයිපරේසියේ (Piperaceae) කුලයට අයත්වන බුලත් විද්‍යාත්මකව පයිපර් බෙට්ලේ (Piper betle L.) යන නාමයෙන් හැඳින්වේ. බහු වාර්ෂික ආරෝහණයක් ලෙස වර්ධනය වන්නා වූ මෙය ගැට සහිත පර්වයන් රාශියකින් සමන්විත අර්ධ කාෂ්ඨීය කඳකින් යුක්ත ය. නිවර්තන කලාපීය ශාකයක් ලෙස වැවෙන බුලත් වැල් මුහුදු මට්ටමේ සිට මීටර් 1000 ක් දක්වා උසකින් යුත් ප්‍රදේශවල ඉතා සාර්ථකව වගා කළ හැක. ශ්‍රී ලංකාවේ බුලත් ප්‍රභේද ලෙස මානේරු, රටදළු, ගල්දළු, ගැට තෝඩු, ගැරඬි මානේරු, නාගවල්ලී, මැටිපලා, කළු බුලත්, ආදිය පෙන්වා දිය හැක (අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2016:03).  බුලත් හා සබැඳි අස්පර්ශිත උරුමය පිළිබඳ විමසීමේ දී බුලත් පිළිබඳ සඳහන් වචන මාලාව, බුලත් හැඳින්වීමට යොදාගන්නා පර්යාය නාමයන්, බුලතේ උපත, බුලතෙහි ගුණ එමෙන් ම මේ හා නිර්මාණය වී ඇති කවි, ගී, තේරවිලි, බුලත් ප්‍රයෝජනයට ගන්නා වැදගත් වේ. බුලත් නාග ලොවේ හටගත් බැවින් නාගවල්ලී, නාලිය, නාගිනි, නාග පත්‍ර, නාගදන්ත, සර්පලතා, නාග ලතා, පණිවල්ලී, භුජංගලතා, පාතතාලවාසී, යන නාමයන්ගෙන් බුලත් හඳුන්වයි. එසේම පොළොවේ වැවෙන වැල් "බූ ලතා" යන්න පසුව බුලත් වී ඇතැයි තවත් අදහසකි. බුලත් හැඳින්වීම සඳහා සිංහල - බුලත්, දෙමළ - වෙත්තිල, සංස්කෘත - තාම්බූල, නාගවල්ලී, ආදි නාමයන් භාවිත වේ (කුලසේකර, 1998:177). බුලතෙහි ඇති ගුණ පිළිබඳ දක්වන සාරාර්ථ සංග්‍රහයට අනුව බුලතෙහි ගුණ දහතුනකි. බුලත් කොළය කටුක රසය, උෂ්ණය, මිහිරිය, කර රසය, කහට රසය, වා සෙම් දෙකේ බලය නසනා සුලුය, පණු උවදුරු දුරලයි, ආහාර දිරවීම පහසු කරවයි, ගැහැණියක හා කතා කිරීමේ දී බුලත් කොළයක් සැපීම අලංකාරය මවයි, ප්‍රේමය වඩවා ශෝකය දුරු කරයි, මේ අයුරින් බුලතෙහි ගුණ දහතුනක් දක්නට ලැබේ. එවැනි බුලත ස්වර්ගයෙහි පවා දුර්ලභය (සේනානායක, 2016:21). බුලත් කෑමට පෙර කොළයේ දෙකොණ කඩා ඉවත් කර කෑමට ගැනීමට පුරුදු වී ඇත්තේ නයිවිස ඇත්නම්

ඉවත් වීම පිණිස බව සමාජ මතයකි. තවත් අදහසක් වන්නේ අතීතයේ පටන් බුලත් සැපීමට මිනිසුන් පුරුදු වී සිටි බැවින් තම හතුරන් විනාශ කිරීම සඳහා බුලත් කොළයේ දෙකොණට විෂ යොදන බවයි. විස දමා ඇති බව නොදනින පුද්ගලයා බුලත් කෑමෙන් විනාශයට පත්වේ. එයින් මිදීම සඳහා බුලත් කොළයේ දෙකොණ කඩා කෑමට පුරුදු වී ඇත. ආසියාතික රටවල ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව බුලත් විට කෑමට රුචිකමක් දක්වයි. බුලත හා නිර්මාණය වූ ප්‍රස්ථාව පිරුළු සහ ඉඟි වැකි ආදිය ද දක්නට ලැබේ. "බුලත් අතට ගම්මිරිස් කොළ තබා වැන්දා වගේ" රැවටීමට උත්සහ කිරීමක්, නිගරු කිරීමක්, කුහක කමක් දැක්වීම, "බුලත් මල්ලට හෙණ ගැහුවම හුණු කිල්ලෝටය ඉතිරි වෙනවා ද?" (රණසිංහ, 2013:120). මේවා ද බුලත් පිළිබඳ දැක්වෙන අස්පර්ශිත උරුමයන් ය. සමාජයේ බුලත් සුභ/අසුභ ක්‍රියා සිදු කිරීම පිණිස භාවිත වේ. වංශකතාවල එන තොරතුරු අනුව අතීතයේ බුලත් සමාජයේ භාවිත වූ අයුරු දැක ගත හැකිය. දුටුගැමුණු රජු රුවන්වැලිසෑය ඉදිකිරීමට මංගල ගඩොල තබන දින පූජාවට එන ජනතාවට සංග්‍රහ කිරීමට පස්පලවතින් බුලත් සුදානම් කර තිබූ බව ථූපවංශයේ සඳහන් වේ (කරුණාතිලක, 2006: 151-158, 178-222 ). එසේම අතීතයේ කාන්තාවන් මුව දෙතොල් වර්ණවත් කරලීම සඳහා බුලත් භාවිත කළ කාව්‍යශේඛරයේ සඳහන් වේ (ගම්ලත්, කීරාල, 2006:254). උපතේ සිට මරණය දක්වා ජීවිතයේ විවිධ සන්ධිස්ථානයන්හි දී සිදුකරනු ලබන ක්‍රියා ද්වාර කර්ම (Rites of passage) ලෙස හැඳින්වේ. මෙම සෑම අවස්ථාවකදි ම බුලත් සමාජයේ භාවිත වන අයුරු දැකගත හැක.

සමස්තයක් ලෙස ගත් කළ ගම්‍ය වන්නේ ජන සමාජය තුළ ඉතා වටිනා අස්පර්ශිත උරුමයන් බුලත හා සම්බන්ධව නිර්මාණය වී ඇති බවයි. මෙම අස්පර්ශිත උරුමය ප්‍රවේණිගතව පැවත එන අතර වර්තමානය වන විට මෙම උරුමය ක්‍රමයෙන් වියෙකෙමින් පවතී. මේ හා සබැඳි අස්පර්ෂිත උරුමයේ විවිධතා ලෙස බුලත් උත්පත්තිය, බුලත්හි ගුණ, වචනාර්ථයන්, බුලත හා බැඳි කවි, ගී, තේරවිලි, තහංචි, සිරිත් විරිත් ආදිය පෙන්වා දිය හැකිය. අතීත සමාජයේ මෙන් ම වර්තමාන සමාජයේ ජීවත්වන ජනතාවට ජනප්‍රිය වූ බුලත් විට කෑම ප්‍රධානව සංග්‍රහ කටයුතු, චාරිත්‍ර ඉටුකිරීමට, ආලේපන ලෙස, ඖෂධ ලෙස, පූජා ද්‍රව්‍යයක් වශයෙන් ද බුලත් භාවිත කරණු දැකිය හැකි වේ. ස්වභාවික උරුමටය අයිතිවාසිකම් කියන ශාකයක් මෙන් ම සංස්කෘතික උරුමයට ද හිමිකම් කියන ශාකයක් ලෙස බුලත් අගය කළ හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**


කුලසේකර, පී. බී., 1998, ***ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ බහුලව යෙදෙන ඖෂධ පැලෑටි***. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බුලත්සිංහල. එෆ්. (1996). ***බුලත හා බැඳුණු සිරිත් විරිත්***. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

බුලත්සිංහල. එෆ්. (1996). ***බුලත්විට හා සිංහලයා***. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.